රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 07/96

මගේ අංකය :-IV-2/9/771(එච්)දේ.පා.(1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.04.01 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**දේශපාලන පළිගැනීම්වලට ලක් වූ සේවකයින්ට**
**<u>මූල්‍යමය වන්දි</u>**

ඒ ඒ අමාත්‍යාංශ විසින් පත් කරන ලද දේශපාලන පළිගැනීම් සොයා බැලීමේ කමිටු විසින් පළිගැනීමට ලක්වූ බවට හඳුනාගත් හා මූල්‍යමය වන්දි නිර්දේශ කරනු ලැබ ඇති අය සඳහා පහත සඳහන් වන්දි ක්‍රියා පරිපාටිය ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත. මෙම ක්‍රියා පරිපාටිය 1995.09.20 දින සිට බලපැවැත්වේ.

**I. <u>වයස අවු. 60 ට අඩු සේවකයින් :</u>**

1995.09.20 දිනට වයස අවු. 60 ට අඩු සේවකයින්, ඔවුන් සියළුම වේතනාධික උපයාගෙන ඇති බව හා යම් ස්වයංක්‍රිය උසස්වීම් ලබා ඇති බව (ශ්‍රේණියෙන් ශ්‍රේණියට) පදනම් කොටගෙන එම සේවකයනට එදිනට අදාළ වැටුප් තලවල නැවත සේවයේ පිහිටවනු ලබන අතර එබඳු සේවකයින්ගේ හිඟ වැටුප් ගෙවිය යුතුය.

**II. <u>වයස අවු. 60 ඉක්මවූ සේවකයින් :</u>**

1995.09.20 දිනට වයස අවුරුදු 60 ඉක්මවන සේවකයින් වයස අවු. 60 සම්පූර්ණවන දින සිට විශ්‍රාම ගැන්විය යුතුය. ඔවුන් සියලුම වේතනාධික උපයාගෙන ඇති බව හා යම් ස්වයංකීය උසස්වීම් (ශ්‍රේණියෙන් ශ්‍රේණියට ) ලබා ගෙන ඇති බව පදනම් කරගෙන ඔවුන් විශ්‍රාම යන දිනට අදාලවන වැටුප් පරිමාණය මත විශ්‍රාම වැටුප සංශෝධනය කල යුතු අතර වයස අවුරුදු 60 සම්පූර්ණ වන තෙක් හිඟ වැටුප් ගෙවිය යුතුය.

**III. <u>විශ්‍රාමිකයින් :</u>**

දේශපාලන පළිගැනීම් කමිටුවේ නිර්දේශ මත නැවත සේවයේ පිහිටුවනු ලබන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප නැවත සේවයේ පිහිටුවන ලද කාලය තුළදී අවුරා තැබිය යුතුය. සිය මනාපයෙන් විශ්‍රාම ගත් තැනැත්තෙකුට මෙය බල පැවැත්වේ.

**IV.** **<u>මිය ගිය සේවයින් :</u>**

මියගිය සේවකයින් ඔවුන් මියගිය දිනය හෝ වයස අවුරුදු 60 සම්පූර්ණවන දිනය යන දින දෙකෙන් පළමුවෙන් එළැඹෙන දිනය දක්වා සියළුම වේතනාධික උපයාගෙන ඇති බව හා යම් ස්වයංක්‍රීය උසස්වීම් (ශ්‍රේණියෙන් ශ්‍රේණියට) ලබා ගෙන ඇති බව පදනම් කරගෙන ඔවුනගේ වැටුප සංශෝධනය කළ යුතු අතර, ඒ අනුව හිඟ වැටුප් ගෙවිය යුතුය. වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප ඒ අනුව සංශෝධනය කළ යුතුය.

**V.** **<u>වයස අවුරුදු 60 ට අඩු හා නැවත සේවයේ පිහිටුවීමට මනාපය නොදක්වන සේවකයින් :</u>**

ඔවුන් සියලුම වේතනාධික උපයාගෙන ඇති බව ස්වයංක්‍රීය උසස්වීම් ලබා ඇති බව පදනම් කරගෙන මෙම වර්ගයට වැටෙන සේවකයින් සඳහා ඔවුන්ගේ සේවය අවසන් කළ දින සිට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නැවත සේවයේ පිහිටුවන කල්පිත දිනය වන 1995.09.20 දින දක්වා වැටුප් ගෙවනු ලැබේ.

**VI.** **<u>අනියම් /තාවකාලික පත්වීම් දරූ සේවකයින් :</u>**

මෙම වර්ගයේ සේවකයින් නැවත සේවයේ පිහිටුවනු නොලබන සාමාන්‍ය පාරිතෝෂිකය මෙන් දෙගුණයක් ඔවුනට ගෙවනු ලැබේ. එනම් ඔවුනට අහිමිවූ සෑම 12 මසක සේවා කාලයක් සඳහා එක් මසක වැටුප් (සේවය අත්හිටවූ දින සිට මෙම සහන ක්‍රියාත්මක 1995.09.20 දින තෙක් ගනන් බලා ) ගෙවනු ලැබේ.
ඉහත කාණ්ඩයේ සේවකයින් නැවත සේවයේ පිහිටුවීම දේශපාලන පළිගැනීම් කමිටු විසින් තීරණය කරන ලද විටකදී අදාළ ආයතනයට එසේ නැවත සේවයේ පිහිටුවීමට ඉඩකඩ ඇතොත් එම තීරණය ඉඩදිය යුතුය.

02. යම් අමාත්‍යාංශයක දේශපාලන පළිගැනීම් කමිටුවක් විසින් යම් සේවක කණ්ඩායමක් සඳහා මෙයට වඩා අඩු සහනයක් නිර්දේශ කර ඇත්නම්, එම කමිටුවේ නිර්දේශ එපරිදිම ක්‍රියාත්මක කළ යුතුය. එසේ නිශ්චිත නිර්දේශයක් කර නොමැති අවස්ථාවලදී පමණක් මෙම වන්දි ක්‍රමය අදාළ කර ගත යුතුය.

03. අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හා දේශපාලන පළිගැනීම් කමිටුව වෙත මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු දැන ගැනීමට සලස්වන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

අ.කලෝ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය